රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
இணைந்த சேவைகள் பிரிவு
சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Combined Services Division
Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය / தொலைபேசி / Telephone: 011- 2694560
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2692254
ඊ- මේල් / மின்னஞ்சல் / E-mail: dgcs@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.pubad.gov.lk

මගේ අංකය / எனது இல / My No: R/9/2/2025
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2026.10.28

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු,
කොමිෂන් සභා ලේකම්වරු,
දිස්ත්‍රික් ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**කුසලතා පදනම මත කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාගය -2025**
**කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2025**

විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වන ලද උක්ත තරග විභාග ප්‍රතිඵල සහ ඒ අනුව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත ඇමුණුම 01 සහ 02හි නම් සඳහන් නිලධාරීන් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති බව රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/PRO/07/2187/2025 හා 2026.08.21 දිනැති ලිපිය සහ අංක PSC/PRO/07/2041/2023 හා 2026.10.27 දිනැති ලිපිය මගින් මා වෙත දනුම් දී ඇත. ඒ අනුව එම නිලධාරීන් සඳහා අදළ උසස්වීම් ලිපි ඉදිරියේ දී යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

| විභාගයේ නම | පත්වීම්ලාභීන් සංඛ්‍යාව | උසස් වීම ක්‍රියාත්මක වන දිනය |
|---|---|---|
| කුසලතා පදනම මත කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාගය - 2025 | 68 | 2025.10.26 |
| කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2025 | 65 | 2025.10.19 |

02. මෙම නිලධාරීන් සඳහා කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධිශ්‍රේණියේ තනතුරට අදළ කාර්යභාරය සම්බන්ධයෙන් වන, දින 10ක සේවාරම්භක පුහුණු වැඩසටහන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී පැවැත්වීමට කටයුතු සූදනම් කර ඇති අතර සේවාරම්භක පුහුණුවට අදළ උපදෙස් ඇමුණුම 03 මගින් දක්වා ඇත.

03. ඒ අනුව, ඉහත පුහුණු පාඨමාලාවට සහභාගි වීම සඳහා එම නිලධාරීන් වෙත රාජකාරි නිවාඩු අනුමත කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි. සේවාරම්භක පුහුණුව අවසානයේදී ඔබට ද පිටපතක් සහිතව නිලධාරියා වෙත ලබා දෙන නව සේවා ස්ථානවලට අනුයුක්ත කිරීමේ ලිපිය අනුව නිලධාරීන් නව සේවා ස්ථානයට නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු නොපමාව සිදු කරන ලෙස ද කාරුණිකව ඉල්ලා සිටිමි.

04. සේවාරම්භක පුහුණුව 2026.11.02 වන දින පෙ.ව. 8.30ට ආරම්භ වන අතර ඒ සම්බන්ධව සියලු දනුවත් කිරීම් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරනු ලබන බව ද සැලකුව මැනවි.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය